## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2015

-------------------------------------------------------------

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ප්‍රදානයන් ගිණුම්ගත කිරීමේදී යොදාගනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ සහ 2012 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු එකතුව රු.14,895,000 ක් වටිනා මෝටර් වාහන 02 වෙනුවෙන් ක්‍රමක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාව වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.13,000,000 ක් වටිනා ඉඩම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංචිත යටතේ පරිත්‍යාග ලෙස සටහන් කලයුතු වුවත් ඉඩම් ලෙස දක්වා තිබුණි.

(ආ) පුහුණු හා දැනුවත් කිරීම් සඳහා දරන ලද රු.288,264 ක වියදම ප්‍රාග්ධන වියදම ලෙස ගිණුම් ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.288,264 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කතරගම වැඩිහිටි නිවාසය හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ නිශ්චල හා චංචල දේපල ජාතික සභාවට පවරාදී තිබුණද, එම වත්කම් තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 2,378,580 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.602,642 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,775,938 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. රජයේ ප්‍රදාන රු.44,020,697 කින් වැඩිවී තිබුණද සමාලෝචිත වර්ෂයට අදාල වියදම් රු.46,259,979 ක් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ප්‍රතිපාදන සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේ සිට සභාවේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

4.1 **කාර්ය සාධනය**

---------------

2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත 13 වන වගන්තියට අනුව පහත සඳහන් කර්තව්‍යයන් ඉටුකළ යුතු වේ.

- වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව රජයට උපදෙස් දීම, ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතන වලට වැඩසටහන් නිර්දේශ කිරීම.

- වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා අදාල අමාත්‍යාංශ, පළාත් බල මණ්ඩල, පළාත් පාලන ආයතන,දිස්ත්‍රික් ලේකම් කාර්යාල,ආගමික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ සංවිධාන වලින් විමසා අවශ්‍ය විය හැකි සියලු පියවර ගැනීම.

- වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යෑම.

- අනාථ වැඩිහිටි තැනැත්තන් සඳහා නවාතැන් සහිතව සුභසාධන මධ්‍යස්ථාන, ක්‍රීඩා මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ වෙනත් සුදුසු ආයතන පිහිටුවීම සඳහා දිරි ගැන්වීම් සහ එවැනි මධ්‍යස්ථානවලට හා ආයතනවලට අවශ්‍ය පහසුකම් සලසා දීම,

- වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා ක්‍රියාවේ යෙදවීම.

- අවශ්‍ය නීති උපදෙස් ලබාගැනීමට වැඩිහිටි තැනැත්තන්ට පහසුකම් සැලසීම සහ මෙම පනතේ 25 වන වගන්තිය යටතේ සහනයක් ලබා ගැනීමට අවශ්‍ය වැඩිහිටි තැනැත්තන්ට උපකාර කිරීම.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ පනතට අනුව කර්තව්‍යයන් 16 ක් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඉන් කර්තව්‍යයන් 08 ක් පමණක් ඇතුළත් කර ඒ සඳහා රු.47,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. කෙසේ වුවද එම කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය පහත පරිදි විය.

(අ) **වැඩිහිටි කමිටු සඳහා මූලාධාර ලබාදීම**

---------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය වැඩිහිටි කමිටු 950 ක් ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල 75 ක්, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 11 ක් සහ පළාත් වැඩිහිටි බලමණ්ඩල 06 ක් වශයෙන් කමිටු 1,042 ක් පිහිටුවීමට රු.5,672,500 ක මුදලක් වෙන් කර තිබූ නමුත් සත්‍ය වශයෙන් පිහිටුවා තිබුණේ ග්‍රාමීය වැඩිහිටි කමිටු 640 ක්, ප්‍රාදේශිය වැඩිහිටි බල මණ්ඩල 06 ක්, දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල 02 ක් හා පළාත් වැඩිහිටි බල මණ්ඩල 03 ක්ද වශයෙන් කමිටු 651 ක් පමණි. ඒ අනුව වැඩිහිටි කමිටු 391 ක් පිහිටුවීමට නොහැකිවී තිබුණු අතර, ඒ සඳහා වෙන්කළ මුදලින් රු.2,322,500 ක් ඉතිරිව පැවතුණි.

(ii) 2011 ජනවාරි 06 දිනැති අංක 2011/01 දරන වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභා චක්‍රලේඛය ප්‍රකාරව ග්‍රාමීය වැඩිහිටි කමිටු නමින් රු.3,500 ක අවම ශේෂයක් සහිතව ඉතිරි කිරීමේ බැංකු ගිණුමක් පවත්වා ගත යුතු නමුත් කමිටු 385 ක ගිණුම් සම්බන්ධයෙන් ශේෂ සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.**

---------------------------------------

සභාව විසින් වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයන් සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීමට වාර්ෂිකව සැලසුම් කර ඒ සඳහා ප්‍රතිපාදන සලසා දී තිබුණද, නිකුත් කරන ලද හැඳුනුම්පත් ප්‍රමාණය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් නිවැරදිව තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. ඒ හේතුවෙන් මේ දක්වා නිකුත් කරන ලද මුළු වැඩිහිටි හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකිවිය.

**(ඇ) ස්වයංරැකියා සඳහා මුදල් ආධාර සැපයීම**

----------------------------------------------

වැඩිහිටි තැනැත්තන්ගේ සුභ සාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම යන අරමුණට අනුකූලව ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ස්වයං රැකියා ආධාර ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40 ක ස්වයං රැකියාලාභීන් 120 දෙනෙකුට රු.1,750,570 ක් ලබා දී තිබුණි.

මෙම ආධාර මුදල් නියමිත පරිදි ස්වයං රැකියා සඳහා යොදවා ගෙන තිබේද යන්න පිළිබඳව පසුවිපරම් කිරීම සිදුකර තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කින් පමණි. තවද ස්වයං රැකියා ලාභීන් 105 දෙනෙකුගෙන් එම මුදල් ලද බවට තහවුරු කරගෙන නොතිබුණි.

**(ඈ) දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම**

-----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් 721 ක් සඳහා ඇස්තමේන්තු ගත වියදම රු.10,000,000 ක් විය.

එහෙත් වර්ෂය අවසානයට වැඩසටහන් 672 ක් පමණක් පවත්වා තිබූ අතර , පුහුණු වැඩසටහන් 49 ක් පැවැත්වීමට නොහැකිවී තිබුණි. පවත්වන ලද වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි.

**(ඉ) වැඩිහිටි නිවාස සුපරීක්ෂණය**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ වැඩිහිටි නිවාස 87 ක් සභාව යටතේ ලියාපදිංචිවී තිබුණද ඉන් නිවාස 72 ක් පිළිබඳව සුපරීක්ෂණයක් සභාව විසින් සිදුකර නොතිබුණි.

**(ඊ) වැඩිහිටි නිවාස සඳහා මූල්‍යාධාර සහ උපකරණ ලබාදීම**

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී වැඩිහිටි නිවාසවලට උපකරණ මිළදී ගැනීමට සහ ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීමට පිළිවෙලින් රු.8,280,120 ක් සහ රු.10,941,728 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) උපකරණ මිලදී ගැනීමට ලබාදුන් මුදලින් රු.8,128,448 ක් වියදම් කර තිබුණු අතර ඉල්ලුම් කරන ලද උපකරණම මිලදී ගෙන තිබේද යන්න පසුවිපරම් කිරීමක් වැඩිහිටි ලේකම් කාර්යාලය විසින් සිදුකර නොතිබුණි.

(ii) ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා රු.10,880,471 ක් ලබාදී තිබුණි. එම අළුත්වැඩියා වලට අදාල මාසික ප්‍රගතිය වැඩිහිටි ලේකම් කාර්යාලය වෙත වාර්තා කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(උ) පනතේ අරමුණු ඉටු නොකළ අවස්ථා**

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාර වැඩිහිටි තැනැත්තන් සඳහා ජාතික සභාව විසින් පහත සඳහන් කර්තව්‍යන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතන වලට වැඩසටහන් නිර්දේශ කිරීම

(ii) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යෑම.

(iii) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළුවලට බලපාන ප්‍රධාන හේතු සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් හඳුනා ගැනීමේ අදහසින් අධ්‍යයනයන් හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ඒ හේතු මර්දනය කිරීම හෝ මුලිනුපුටා දැමීම සඳහා සහ ඔවුන්ගේ ඒ අවශ්‍යතා හා අභිලාෂ ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(iv) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළු අවශ්‍යතාවයන් හා අභිලාෂයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් අධ්‍යයනයන් හා පර්යේෂණවල සොයා ගැනීම්වලට සුදුසු සියලු ක්‍රියා මාර්ග මගින් නිසි ප්‍රචාරයන් ලබාදීම.

(v) වැඩිහිටි තැනැත්තන්ගේ තත්ත්වය නගාලීම සඳහා රජය විසින් සහ ස්වේච්ඡා සංවිධාන හා පුද්ගල මණ්ඩල විසින් ආරම්භ කරන ලද හා ක්‍රියාවේ යොදවනු ලබන වැඩසටහන් හා යෝජනා ක්‍රම සමීක්ෂණය කිරීම හා සම්බන්ධිකරණය කිරීම.

(vi) වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා ක්‍රියාවේ යෙදවීම.

(vii) වැඩිහිටි තැනැත්තන්ගේ දැන ගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති වැටුප් ගෙවන හා වැටුප් නොගෙවන රැකියා අවස්ථා පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරත වීම සඳහා උපකාර කිරීම.

(viii) මහජනතාවගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාවන් සහ දක්ෂතා ඇතුලත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යෑම.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් 96 දෙනෙකු පත්කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණද, එම නිලධාරීන් මගින් මෙතෙක් ක්‍රියාත්මක නොවූ කර්තව්‍යයන් ඉටුකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම නිසා දිස්ත්‍රික්ක කිහිපයකට නිලධාරීන් පත්කර නොතිබුණි.

(ඇ) සභාවේ සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ නීති නිලධාරී තනතුර 2011 වර්ෂයේ සිටම පුරප්පාඩුවී පැවතුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩිහිටි සුභසාධනය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පවතින රු.6,974,959 ක ස්ථාවර තැන්පතුව හා එහි වාර්ෂික පොලී ආදායම් වැඩිහිටි සුභසාධන කටයුත්තකට නොයොදා නිශ්කාර්යව පැවතුණි.

(ආ) සභාවේ විවිධ තැන්පතු වශයෙන් රු.4,020,208 ක වගකීමක් ගිණුම්වල සටහන් වී තිබුණු අතර එම වටිනාකමින් රු.1,370,041 ක් නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිවී තිබුණි.

**4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් සහ ගොඩනැගිලිවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

2003 අගෝස්තු 22 දින සමාජ සේවා අධ්‍යක්ෂක විසින් කතරගම වැඩිහිටි නිවාසය හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයට අයත් සියලු නිශ්චල හා චංචල දේපල සභාවට පවරා දී අවුරුදු 12 ක කාලයක් ගතවී තිබුණද එම ඉඩම හා ගොඩනැගිල්ල මැනුම් කර ඔප්පුවක් සකස් කර ගැනීමට කටයුතු නොකර 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අලුත්වැඩියා සහ ඉදිකිරීම් වෙනුවෙන් රු.11,974,436 ක් සභාව විසින් වියදම් දරා තිබුණි.

**4.5 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ගිණුම්වල පාරිතෝෂික ගෙවීම සඳහා වූ ප්‍රතිපාදනය රු.10,720,215 ක් වූ නමුත් අනාගතයේ උද්ගතවන පාරිතෝෂික ගෙවීමේ අවස්ථාවලදී ඒ සඳහා යොදාගැනීමට හැකිවන පරිදි ඊට සරිලන මුදලක් ආයෝජනය කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2012 සිට 2016 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැළැස්ම පිළියෙල කර තිබුණද එය පාලක සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

ක්‍රියාකාරී සැළැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සභාව විසින් හඳුන්වා දී නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ජාතික සභාවේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) ගිණුම් කරණය | - නිසිපරිදි වත්කම් හා පරිත්‍යාග ගිණුම් ගත නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩලය | - කාර්ය මණ්ඩල පුරප්පාඩු නොපිරිවීම හා කාර්ය මණ්ඩල අඩුපාඩු හේතුවෙන් කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට ළඟාකරගත නොහැකිවීම. |